# කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

# 2012

## වාර්ෂික කාර්යසාධන වාර්තාව


**මහා භාණ්ඩාගාරය**

**කොළඹ - 01**

දුරකථන : 011 -2484757

ෆැක්ස් : 011-2430270

ඊ-මේල් : dgms@msd.treasury.gov.lk

# දැක්ම

**රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය, පාරිශ්‍රමික කළමනාකරණය හා උපදේශකත්වය පිළිබඳ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වීම**

# මෙහෙවර

**රාජ්‍ය සේවය විශිෂ්ට මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය කළමනාකරණ සහාය රාජ්‍ය ආයතන වෙත ලබාදීම**

## අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ..........................

රාජ්‍ය අංශය ශක්තිමත් කර, වඩාත් කාර්යක්ෂම හා මිත්‍රශීලී සේවාවක් ජනතාවට ලබාදීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුගත වෙමින් මානව සම්පත, වඩාත් ඵලදායී අයුරින් කළමනාකරණය කිරීමේ අභියෝගාත්මක කාර්යයට 2012 වර්ෂයේදී සාර්ථකව මුහුණ දීමට හැකිවිය.

ශ්‍රී ලංකාව ආසියාවේ මෙන්ම ලෝක ආර්ථිකය තුළ ද ප්‍රබල ස්ථානයකට පත්කිරීමේ රජයේ ප්‍රමුඛ අරමුණ සාක්ෂාත් කරගත හැකි නිපුණතාවයන්ගෙන් හෙබි කුසලතා පූර්ණ රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණයි. ඒ අනුව 2012 වර්ෂය, රාජ්‍ය සේවය තුළ ප්‍රශස්ත කාර්ය මණ්ඩලයක් තීරණය කිරීම කෙරෙහි ප්‍රබල දායකත්වයක් ලබා දුන් වසරක් විය.

අප දෙපාර්තමේන්තුවේ කාර්යභාරය මැනවින් ඉටු කිරීම උදෙසා නිසි මග පෙන්වීම හා සහයෝගය ලබා දුන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් හා භාණ්ඩාගාරයේ ලේකම් ආචාර්ය පී.බී.ජයසුන්දර මැතිතුමාට, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරුන්ට සහ සහෝදර දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මාගේ ප්‍රණාමය පුද කරමි. වැදගත් කාර්යභාරයක් ඉටු කරමින් සහයෝගය දැක්වූ, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව, මුදල් කොමිෂන් සභාව සහ අනෙකුත් රේඛීය අමාත්‍යාංශ නිලධාරීන්ට ද මාගේ ප්‍රණාමය පුද කරමි. තව ද, දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටු කිරීමට සංවිධානාත්මකව, කණ්ඩායම් හැඟීමෙන් හා සහයෝගයෙන් කටයුතු කළ කාර්ය මණ්ඩලයට ද ප්‍රශංසාව පිරිනමමි.

**එන්. ගොඩකන්ද**

**අධ්‍යක්ෂ ජනරාල්**

# පටුන


පිටුව

1. හැඳින්වීම 1
2. කාර්ය මණ්ඩල කළමනාකරණය 3
3. වැටුප් හා පාරිශ්‍රමික කළමනාකරණය 10
4. පර්යේෂණ කටයුතු, තොරතුරු හා දත්ත පද්ධතිය 11
5. ආයතන අංශය 14
6. මූල්‍ය අංශය 21


## උපලේඛන


I. සංවිධාන ව්‍යුහය 23

# 1. හැඳින්වීම

## 1.1 ආරම්භය

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ පළමු ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස 1999 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරනු ලැබීය. එතැන් සිට ජාතික, පළාත් හා පළාත් පාලන මට්ටමින් රාජ්‍ය අංශයේ සේවා අවශ්‍යතාවයන් පදනම් කර ගනිමින් ආයතනික මට්ටමින් අවශ්‍ය වන ප්‍රශස්ත කාර්ය මණ්ඩලය හඳුනාගැනීමත්, එම හඳුනාගන්නා තනතුරුවලට අදාළ වැටුප් තීරණය කිරීමත් බඳවා ගැනීම් /උසස් කිරීම් පරිපාටි සඳහා අනුමැතිය ලබාදීමත් ආදී කටයුතු මගින් රාජ්‍ය අංශයේ මානව සම්පත ඵලදායි ලෙස කළමනාකරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ උපරිම දායකත්වය සපයා ඇත. මෙහිදී රටේ මූල්‍ය තත්ත්වය, සංවර්ධන විභවතාවය, කුසලතා පූර්ණ රාජ්‍ය සේවයක් ඇති කිරීම වැනි අංශ කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කිරීම ඉතා අත්‍යවශ්‍ය විය. මේ සඳහා කාලීන අවශ්‍යතා පරිදි අදාළ අනෙකුත් ආයතන සමඟද මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් කාර්ය මණ්ඩල සමාලෝචන තුළින් රාජ්‍ය අංශයට අවශ්‍ය ප්‍රශස්ත මානව සම්පත් පවත්වා ගැනීමට දෙපාර්තමේන්තුව ප්‍රබල දායකත්වයක් ලබා දී ඇත.

## 1.2 පරමාර්ථ

වඩාත් ඵලදායී මානව සම්පතක් රාජ්‍ය අංශය තුළ ස්ථාපිත කිරීම උදෙසා පරමාර්ථ කිහිපයකින් මෙම දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ.

i. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය
ii. ජාතික වැටුප් ප්‍රතිපත්තීන්ට අනුකූලව වැටුප් හා දීමනා තීරණය කිරීම
iii. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා පිළිබඳව අධ්‍යයන සිදු කිරීම

## 1.3 කාර්යභාරය

i. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට/අග්‍රස්ථ ආයතනයන්ට සේවා සැපයීම.
ii. රාජ්‍ය අංශයෙහි ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, ක්‍රියාත්මක කිරීම සහ ඒ පිළිබඳ අන්වේෂණය පවත්වා ගැනීම.
iii. මෙහෙවර, පරමාර්ථ, ක්‍රම පද්ධති, පරිපාටි සහ කාර්ය මණ්ඩල සම්පාදනය පිළිබඳ ආයතනික සමාලෝචන පවත්වා අදාළ බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.
iv. රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම හා නිසි ප්‍රමාණයට සැකසීම අරමුණු කොට ගෙන රාජ්‍ය අංශයේ ආයතනවල ද්විත්වකාරක (Duplicating) කාර්යයන් හඳුනා ගැනීම.
v. රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව හා ඵලතාවය සහතික කිරීමේ අදහස පෙරදැරිව ආයතනික හා කාර්ය මණ්ඩල සමාලෝචන පැවැත්වීම, ක්‍රම පද්ධති වැඩි දියුණු කිරීම, සංවිධාන ව්‍යුහයන් ගොඩනැඟීම හා ශක්තිමත් කිරීම.
vi. සේවක සංඛ්‍යා අවශ්‍යතාවන් පිළිබඳ සම්මත මිණුම් සහ ප්‍රමිතීන් ගොඩනගා ගැනීම.
vii. අතිරික්ත සේවක සංඛ්‍යාවන් හඳුනා ගැනීම, ඔවුන් නැවත සුදුසු පරිදි යෙදවීම සහ සේවාහරණය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

viii. භෞතික පරිසරය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවයන්, යාන්ත්‍රීකරණය/පරිගණකගතකරණය සහ සේවාවන් කොන්ත්‍රාත් දීම සඳහා වන ක්ෂේත්‍ර හඳුනා ගැනීම.

ix. සංවර්ධන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සේවා ව්‍යවස්ථා, සේවා කොන්දේසි සමාලෝචනය පිළිබඳ අධ්‍යයනයන්හි යෙදීම සහ යෝජනා ඉදිරිපත් කිරීම.

x. රාජ්‍ය අංශය තුළ විශ්‍රාමික නිලධාරීන් යළි සේවයේ යෙදවීම, උපදේශකයින් යොදවා ගැනීම පිළිබඳ යෝජනා පරීක්ෂා කර බලා නිර්දේශ ඉදිරිපත් කිරීම.

xi. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයෙහි කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පද්ධති පවත්වා ගැනීම සහ අතිවැදගත් තනතුරු සඳහා අනුප්‍රාප්තිය සැලසුම් කිරීම.

xii. බඳවා ගැනීමේ ප්‍රතිපත්ති, දක්ෂතා සංවර්ධන පුහුණු සහ අනුප්‍රාප්තිය සැලසුම් කිරීම පිළිබඳ අධ්‍යනයන්හි සහ ඒවා ක්‍රියාත්මක කිරීමෙහි ලා අදාළ බලධාරීන්ට සහාය වීම.

xiii. රාජ්‍ය අංශයේ වැටුප් සහ ප්‍රසාද දීමනා, දිරිකාරක යෝජනා ක්‍රම, සුභ සාධක යෝජනා ක්‍රම සහ වෙනත් එවැනි පාරිශ්‍රමික සංවිහිතීන් පිළිබඳ කළමනාකරණය.

xiv. පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනික සමාලෝචනය, සේවක සංඛ්‍යා සහ වැටුප් කළමනාකරණය පිළිබඳව උපදේශාත්මක සේවා සැලසීම.

xv. රාජ්‍ය හා සංස්ථා අංශ සඳහා වෘද්ධෝපගත ප්‍රතිලාභ යෝජනා ක්‍රම පිළිබඳ අධ්‍යයනයන්හි නිරත වීම.

## 2. කාර්ය මණ්ඩල කළමනාකරණය

රාජ්‍ය අංශයේ මානව සම්පත් කළමනාකරණයේදී, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පහත සඳහන් ප්‍රධාන කාර්යයන්ගෙන් සමන්විත වේ.

- නව තනතුරු අළුතින් ඇති කිරීම සඳහා අනුමැතිය ලබා දීම
- තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලබා දීම
- තනතුරු යටපත් කිරීම
- තනතුරු නාම සංශෝධනය කිරීම
- රාජ්‍ය ව්‍යාපෘතීන් සඳහා වූ කාර්ය මණ්ඩල අනුමත කිරීම හා වැටුප් තීරණය කිරීම

ඒ අනුව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය ව්‍යාපෘතින් වැනි අංශයන්හි කාලීනව පැන නගින මානව සම්පත් අවශ්‍යතාවයන්ද රටේ ආර්ථික සංවර්ධන ඉලක්කයන්ද සැලකිල්ලට ගෙන රට තුළ ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් පවත්වා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2012 වර්ෂය තුළ දී ඉටු කළ කාර්යභාරය පහතින් විස්තර කර දක්වා ඇත.

### 2.1 රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය හා ආංශික සංයුතිය

2012.12.31 දිනට ජාතික, පළාත් හා පළාත් පාලන ආයතන මට්ටමින් රාජ්‍ය අංශයේ සමස්ථ සේවා නියුක්තිය 1,279,849 ක් විය. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන, බැංකු හා මුල්‍ය ආයතන ඇතුළත් රාජ්‍ය ව්‍යවසායන්, පළාත් සභා, පළාත් පාලන ආයතන සහ ආරක්ෂක හමුදාවන්ගෙන් සමන්විත රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩල සංයුතිය ජාතික, පළාත් හා පළාත් පාලන මට්ටමින් පහතින් දැක්වේ.

**වගු අංක - 01 රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය - 2012**

| පරිපාලන මට්ටම | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජාතික මට්ටම | 956,009 | 900,916 |
| පළාත් මට්ටම | 334,877 | 329,652 |
| පළාත් පාලන ආයතන | 50,685 | 49,281 |
| **එකතුව** | **1,341,571** | **1,279,849** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 2.2 රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය - 2012

රාජ්‍ය සේවා කාර්යක්ෂමව හා ඵලදායීව මහජනතාව වෙත සැපයීම පහසු කිරීම උදෙසා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන, බැංකු හා මූල්‍ය ආයතන ඇතුලු රාජ්‍ය ව්‍යවසායන් වෙතින් ලද සේවක මණ්ඩල අවශ්‍යතා ඉල්ලීම් පිළිබඳව සැලකිලිමත් වෙමින් 2012 වසර තුළදීද රාජ්‍ය අංශය තුළ ප්‍රශස්ත මට්ටමින් සේවක සංඛ්‍යාවන් පවත්වා ගෙන යාම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. සේවා අවශ්‍යතා අනුව තනතුරු අලුතින් ඇති කිරීම, අදාළ අවස්ථාවන්හී දි පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා දීම, කාලීන හා සේවා අවශ්‍යතාවන් අනුව තවදුරටත් පවත්වාගෙන යාමට අවශ්‍ය නොවන තනතුරු යටපත් කිරීම, තනතුරු නාම සංශෝධනය, වැටුප් කාණ්ඩ තීරණය කිරීම ආදී කාර්යයන් මඟින් රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සහයෝගය දක්වා ඇත.

2012 වසර තුළ රාජ්‍ය අංශය සඳහා තනතුරු අලුතින් ඇති කිරීමේදී, රටේ සංවර්ධන අවශ්‍යතාවන් සඳහා උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය විශේෂයෙන් සඳහන් කළ යුතු වේ. මේ යටතේ "සංවර්ධන නිලධාරි" තනතුරු නාමය යටතේ උපාධිධාරී තනතුරු 25,201 ක් 2012 වසර තුළ අලුතින් ඇති කිරීමට කටයුතු කරන ලදි. මෙම සංඛ්‍යාව 2012 වසර තුළ රාජ්‍ය අංශය සඳහා අලුතින් ඇති කරන ලද තනතුරු 49,157 න් සියයට 51 ක ප්‍රතිශතයක් වැනි ඉහළ අගයක් ගෙන ඇත.

### 2.2.1 නව තනතුරු ඇතිකිරීම - 2012


තනතුරු අලුතින් ඇතිකිරීමේ දී අදාළ ආයතනවලට පැවරී ඇති කාර්යභාරය, රටේ මූල්‍ය ශක්‍යතාවය හා අයවැය ප්‍රතිපාදන මෙන්ම තනතුරු අලුතින් ඇති කිරීමේ කාලීන අවශ්‍යතාවයද සැලකිල්ලට යොමු කරන ලදී. රාජ්‍ය අංශය සඳහා තනතුරු අලුතින් ඇති කිරීම පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා සංවර්ධන ව්‍යාපෘති මට්ටමින් කරන ලද වර්ගීකරණය 2009-2012 අතර සංසන්දනාත්මක තොරතුරු සමඟින් පහත වගු අංක 02 මඟින් දක්වා ඇත.

**වගු අංක - 02 නව තනතුරු ඇති කිරීම - 2009 – 2012**


| ආයතනය | 2009 | | 2010 | | 2011 | | 2012 | |
|---|---|---|---|---|---|---|---|---|
| | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | තනතුරු සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
| අමාත්‍යාංශ | 1,769 | 4.0 | 1,095 | 20.7 | 1,498 | 37.9 | 28,753 | 58.5 |
| දෙපාර්තමේන්තු | 40,095 | 90.0 | 828 | 15.6 | 1,140 | 28.9 | 8,004 | 16.3 |
| පළාත් සභා | 1,641 | 3.7 | 2,811 | 53.0 | 523 | 13.2 | 8572 | 17.4 |
| ව්‍යවස්ථාපිත ආයතන | 1,027 | 2.3 | 568 | 10.7 | 534 | 13.5 | 2217 | 4.5 |
| සංවර්ධන ව්‍යාපෘති | | | | | 255 | 6.5 | 1,611 | 3.3 |
| **එකතුව** | **44,532** | **100** | **5,302** | **100** | **3,950** | **100** | **49,157** | **100** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## නව තනතුරු ඇති කිරීම 2012




## නව තනතුරු ඇති කිරීම 2009 – 2012



### 2.2.2 තනතුරු පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දීම - 2012

2007.08.01 හා 2007.10.15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 36 හා 36 (I) මඟින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හි සඳහන් MN, MT, SL හා PL වැටුප් ක්‍රමයන්ට අදාළ තනතුරු දරණ නිලධාරීන් විශ්‍රාම ගැනීම/ඉල්ලා අස්වීම/මියයාම/සේවය අතහැර යාම වැනි හේතු නිසා රාජ්‍ය සේවයේ හා පළාත් පාලන ආයතන ඇතුළු පළාත් රාජ්‍ය සේවයේ ඇතිවන තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම්/පත් කිරීම් සඳහා බලතල අදාළ රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් ප්‍රධාන ලේකම්වරු වෙත පැවරීමට කටයුතු කර ඇත. එසේ වුවද මෙම චක්‍රලේඛ උපදෙස් මඟින් ආවරණය නොවන තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා තවදුරටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය විය. ඒ අනුව සේවා අවශ්‍යතාවයන් පිළිබඳ අවධානය යොමු කරමින්, 2012 වසර තුළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇතුළු රාජ්‍ය අංශයේ ආයතන වෙතින් ලද ඉල්ලීම් අනුව තනතුරු පුරප්පාඩු 8952 ක් සම්පූර්ණ කිරීම සඳහා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා දී ඇත.

**වගු අංක - 03 තනතුරු පුරප්පාඩු පිරවීමට අනුමැතිය ලබා දීම - 2012**

| ආයතනය | සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|
| අමාත්‍යාංශ | 2,838 | 32 |
| දෙපාර්තමේන්තු | 2,765 | 31 |
| පළාත් සභා | 3,349 | 37 |
| **එකතුව** | **8,952** | **100** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

### 2.2.3 තනතුරු යටපත් කිරීම හා තනතුරු නාම සංශෝධනය

රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා කළමනාකරණයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය, පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අනුමැතිය ලබා දීම හා තනතුරු අලුතින් ඇති කිරීම අනුමත කිරීමට පමණක් සීමා නොවේ. රාජ්‍ය ආයතනවල පවතින ඵලදායී හා කාලීන නොවන තනතුරු හඳුනා ගැනීම, අදාළ ආයතනවල ද එකඟතාවය සහිතව එම තනතුරු යටපත් කිරීම, කාලීන අවශ්‍යතාවයන් අනුව තනතුරු නාම සංශෝධනය කිරීම, රාජකාරි ස්වභාවයන් අනුව පවතින තනතුරු ඒකාබද්ධ කිරීම වැනි කටයුතුද දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් අතරට ගැනේ. මෙම කටයුතු ඉටු කිරීමේදී දෙපාර්තමේන්තුව සතු දත්ත පද්ධතිය හා පර්යේෂණ අංශයේ කාර්ය මණ්ඩලය ඵලදායි ලෙස යොදා ගැනේ. 2009 - 2012 අතර කාලය තුළ රාජ්‍ය අංශයේ යටපත් කරනු ලැබූ තනතුරු පිළිබඳ සංසන්දනාත්මක තොරතුරු වගු අංක 04 මඟින් දක්වා ඇත.

**වගු අංක - 04 තනතුරු යටපත් කිරීම - 2009 - 2012**

| ආයතනය | යටපත් කරන ලද තනතුරු සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | **2009** | **2010** | **2011** | **2012** |
| අමාත්‍යාංශ | 465 | 12 | 32 | 95 |
| දෙපාර්තමේන්තු | 1208 | 174 | 512 | 1853 |
| පළාත් සභා | 165 | 329 | 62 | 66 |
| ව්‍යවස්ථාපිත ආයතන | 250 | 24 | 66 | 8 |
| **එකතුව** | **2088** | **539** | **672** | **2022** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 2.3 ව්‍යාපෘති කාර්ය මණ්ඩල අනුමත කිරීම හා වැටුප් කළමනාකරණය

ජාතික හා පළාත් මට්ටමින් රට තුළ ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන ව්‍යාපෘති, සැළසුම් ගත කාල වකවානු තුළ නිම කිරීම සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩල සඳහා අනුමැතිය ලබාදීම හා එම තනතුරුවලට අදාළ වැටුප් තීරණය කිරීම 2007.04.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 මගින් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. 2012 වසර තුළදී ද මෙම කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අදාළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන රේඛීය අමාත්‍යාංශ/පළාත් සභා, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත ඉහළ සහයෝගයක් ලබා දුනි. 2011 වසර තුළදී ව්‍යාපෘති 10 ක් යටතේ අනුමත කරන ලද තනතුරු 255 සමඟ සංසන්දනයේදී 2012 වසර තුළ සංවර්ධන ව්‍යාපෘති 27 ක් යටතේ නව තනතුරු 1611 ක් ඇති කිරීමට කටයුතු කර ඇත.

**වගු අංක - 05 ව්‍යාපෘති කාර්ය මණ්ඩල අනුමත කිරීම - 2012**

| අනු අංකය | ව්‍යාපෘතිය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශවල හදිසි සංවර්ධන ව්‍යාපෘතිය | 28 |
| 02 | කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | 339 |
| 03 | ශ්‍රී ලංකා පශ්චාත් සුනාමි නැගෙනහිර වෙරළ කළාප ප්‍රතිස්ථාපන හා තිරසාර කළමනාකරණ ව්‍යාපෘතිය | 01 |
| 04 | ආරක්ෂක මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණ ව්‍යාපෘතිය | 53 |
| 05 | පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 123 |
| 06 | පළාත් මාර්ග ව්‍යාපෘතිය - නැගෙනහිර පළාත | 01 |
| 07 | දියුණු වෙමින් පවතින ප්‍රදේශ ඉලක්ක කරගත් මූලික සමාජ සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය<br><br>සබරගමු පළාත - වරකාපොළ මූලික රෝහල<br>වයඹ පළාත - ගල්ගමුව මූලික රෝහල<br>මධ්‍යම පළාත - තෙල්දෙණිය මූලික රෝහල<br>නැගෙනහිර පළාත - කලවංචිකුඩි මූලික රෝහල | <br><br>10<br>10<br>10<br>10 |
| 08 | පළාත් මාර්ග ව්‍යාපෘතිය | 01 |
| 09 | දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන පාසල් අධ්‍යාපන දැනුම කේන්ද්‍රය පදනම් කරගත් අධ්‍යාපන ක්‍රමයට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය | 14 |
| 10 | ඉරනමඩු වාර්මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 16 |
| 11 | ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ හා අධීක්ෂණ රාමුවක් සඳහා වූ ව්‍යාපෘතිය | 41 |
| 12 | මහනුවර නගර අපජල කළමනාකරණ පද්ධතිය | 09 |
| 13 | විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය | 48 |
| 14 | රුහුණුපුර ජල සම්පාදන ව්‍යාපෘතිය | 57 |
| 15 | කොලොන්න - බලංගොඩ ජල සම්පාදන ව්‍යාපෘතිය | 31 |
| 16 | උතුරු හදිසි පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 23 |
| 17 | ප්‍රමුඛතා මාර්ග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අදියර I | 170 |
| 18 | උතුරු පළාතේ ජාතික මාර්ග ජාලය වැඩිදියුණු කිරීම | 204 |
| 19 | ප්‍රමුඛතා මාර්ග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය අදියර II | 223 |

| | | |
|---|---|---|
| 20 | මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය | 52 |
| 21 | ජාතික මාර්ග ආංශික ව්‍යාපෘතිය | 13 |
| 22 | කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ගය - කඩවත සිට කඩුවෙල දක්වා | 34 |
| 23 | සෞදි ආධාර පිණිස හඳුනාගත් මාර්ග පුනරුත්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය | 11 |
| 24 | වානේ පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය අදියර II - වේයන්ගොඩ ගුවන් පාලම | 26 |
| 25 | හදිසි ස්වභාවික ආපදා පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 07 |
| 26 | උතුරු මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය - අතිරේක මූල්‍යායනය | 22 |
| 27 | පාලම් 46 ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | 24 |
| | **එකතුව** | **1611** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 2.4 පළාත් සභා කාර්ය මණ්ඩල සමාලෝචනය

පළාත් සභා විසින් මහජනතාවට සපයනු ලබන සේවාවන් කාර්යක්ෂම හා ඵලදායි ලෙස සිදුකිරීම තහවුරු කරනු වස් පළාත් සභා හා පළාත් පාලන ආයතන සඳහා අවශ්‍ය වන ප්‍රශස්ත සේවක සංඛ්‍යාවක් හඳුනා ගැනීමේ පරමාර්ථයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2012 වසරේදී කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කරන ලදි. මෙහිදී එක් එක් ආයතනයේ වැඩ පරිමාව, ක්‍රියාකාරිත්වය, එක් එක් තනතුරට අදාළ සුදුසුකම් සහ බඳවා ගැනීමේ ක්‍රම, අදාළ වැටුප් පරිමාණයන්, තනතුරු නාම සහ අයවැය ප්‍රතිපාදන යන කරුණු කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කරමින් කාර්ය මණ්ඩල අවශ්‍යතා පිළිබඳව සලකා බලන ලදි.

**වගු අංක - 06 පළාත් සභා සඳහා අනුමත තනතුරු සංඛ්‍යාව**

| පළාත් සභාව | ජනගහනය | දිස්ත්‍රික් සංඛ්‍යාව | සංශෝධිත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර | 5,821,710 | 3 | 81,844 |
| මධ්‍යම | 2,558,716 | 3 | 50,326 |
| වයඹ | 2,370,075 | 2 | 47,059 |
| දකුණ | 2,464,732 | 3 | 46,445 |
| නැගෙනහිර | 1,551,381 | 3 | 33,871 |
| සබරගමුව | 1,918,880 | 2 | 33,691 |
| උතුර | 1,058,762 | 5 | 32,051 |
| ඌව | 1,259,900 | 2 | 31,195 |
| උතුරු මැද | 1,259,567 | 2 | 29,080 |
| **මුළු එකතුව** | **20,263,723** | **25** | **385,562** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් 1987 වර්ෂයේ දී පිහිටවනු ලැබූ පළාත් සභා ක්‍රමය මඟින්, රජය විසින් සපයනු ලබන සේවාවන් කාර්යක්ෂම හා ඵලදායිව මහජනයා වෙත සමීප කරවීම අපේක්ෂා කරනු ලැබීය. එසේ වුවද 1987 සිට මේ දක්වා පළාත් සභා අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / ආයතන මෙන්ම පළාත් පාලන ආයතන සඳහාද අවශ්‍ය කරන ප්‍රශස්ත කාර්ය මණ්ඩලයක් හඳුනා ගැනීමේ විධිමත් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. එනිසාම පළාත් සභා හා පළාත් පාලන ආයතනවල  අනුමත තනතුරු සංඛ්‍යා සේවා අවශ්‍යතාවයන්ට  අදාළ වන පරිදි ගැළපීම් කර තිබුනේ ද නැත. සමහර ආයතන සඳහාද අතිරික්ත කාර්ය මණ්ඩලයක් අනුමතව තිබූ අතර සමහර ආයතන සඳහා සේවා අවශ්‍යතාවයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුමතව තිබුනේ නැත. එසේම භාවිතා කළ තනතුරු නාම හා වැටුප් පියවරයන් අතර ද විවිධ විෂමතා දක්නට වූ අතර, අනුමත තනතුරු නොමැතිව සිදු කළ අවිධිමත් බඳවා ගැනීම් ද දක්නට විය. එබැවින් පළාත් සභා හා පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් විධිමත් කාර්ය මණ්ඩල සමාලෝචනයක කාලීන අවශ්‍යතාවය දැඩිව දක්නට විය.

ඒ අනුව පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයත්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවත්, මුදල් කොමිෂන් සභාවත් දායක කරගනිමින් 2012 වර්ෂය තුළ දී සිදු කළ පළාත් සභා කාර්ය මණ්ඩල සමාලෝචනය සඳහා සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරු හා  සියලු ආයතන ප්‍රධානීන් ද සහභාගී කරවාගත් අතර, එක් එක් ආයතනයට පැවරී ඇති කාර්යභාරය, ඒ සඳහා අවශ්‍ය වන ප්‍රශස්ත කාර්ය මණ්ඩලය, අදාළ නිවැරදි වැටුප් පරිමාණයන්, නිවැරදි තනතුරු නාමයන් සහිතව විස්තරාත්මකව මෙම සමාලෝචනය සිදු කරන ලදී. එසේම මෙම සමාලෝචනයෙන් පසු අනුමත කරනු ලබන තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි සකස් කර විධිමත් අනුමැතියක් ලබාගැනීමේ අවශ්‍යතාවයද අවධාරණය කරන ලදි. මෙම කරුණුවලට අමතර වශයෙන්, පළාත් සභා විසින් ප්‍රඥප්ති සම්මත කර පිහිටුවා තිබූ  ව්‍යවස්ථාපිත ආයතන බොහොමයකට මෙතෙක්  අනුමත කාර්ය මණ්ඩලයක් මෙන්ම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 විධිවිධාන පරිදි අනුමත වැටුප් පරිමාණයන්ද නොවූ අතර, මෙම කාර්ය මණ්ඩල සමාලෝචනයේ දී එවැනි ආයතන සඳහා ද පැවරී ඇති කාර්යයන්ට ගැළපෙන කාර්ය මණ්ඩලයක් සහ වැටුප් පියවරයන් සඳහා අනුමැතිය ලබාදීමට කටයුතු කරන ලදි.

2012 පළාත් සභා කාර්ය මණ්ඩල සමාලෝචනය යටතේ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තු හා පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තු යටතේ පවතින සියලුම රෝහල් හා අනෙකුත් ආයතන සඳහා කාර්ය මණ්ඩල එකී රෝහල් හා ආයතන මට්ටමින් හඳුනාගෙන අනුමත කිරීමට කටයුතු කිරීම විශේෂයෙන් සඳහන් කළ යුතුය. එසේම පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තු හා පරිවාස හා ළමාරක්ෂක  සේවා දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන ආයතන සඳහා ද එකී ආයතන මට්ටමින් අවශ්‍ය ප්‍රශස්ත කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබාදීමට කටයුතු කරන ලදි. එලෙසින්ම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු යටතේ පවතින සියළු පාසල් සඳහා අවශ්‍ය වන ප්‍රශස්ත කාර්ය මණ්ඩලය, එම පාසැල් මට්ටමින් අනුමත කිරීමේ කටයුතු ඉදිරියේ දී සිදු කිරීමට නියමිතය. මෙලෙස අධ්‍යාපන, සෞඛ්‍ය වැනි සේවා සඳහා ආයතන මට්ටමින් කාර්ය මණ්ඩල නිශ්චය කොට අනුමත කිරීම තුළින් එම  අවශ්‍යම සේවා නගරවලින් බැහැර දුෂ්කර ප්‍රදේශවල වාසය කරන ජනතාවට අපහසුවකින් තොරව ලබාගැනීමේ අයිතිය තහවුරු කෙරනු ඇත.

## 3. වැටුප් හා පාරිශ්‍රමික කළමනාකරණය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය අතර රාජ්‍ය අංශයේ වැටුප් හා ප්‍රසාද දීමනා, දිරිකාරක යෝජනා ක්‍රම හා වෙනත් පාරිශ්‍රමික පිළිබඳ කළමනාකරණයද ඉතා වැදගත් ස්ථානයක් උසුලනු ලැබේ. මෙම කාර්යයේදී ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව හා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ නිරීක්ෂණ හා නිර්දේශද සැලකිල්ලට ගෙන තීරණ ලබා දීමට දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලැබේ. වැටුප් හා පාරිශ්‍රමික පිළිබඳ ප්‍රායෝගික ගැටලු පැන නගින අවස්ථාවලදී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් කරනු ලබන විමසීම්වලදී අවශ්‍ය උපදෙස් ලබා දීම ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි. 2012 වසරේදී ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 හා ඊට අදාළ සංශෝධනයන්ට අනුරූපී වන පරිදි ව්‍යවස්ථාපිත ආයතනවල ප්‍රතිව්‍යුහගතකරණ කටයුතු මෙන්ම වැටුප් හා දීමනා තීරණය කිරීම පිළිබඳව ද දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබා දී ඇත. එම කටයුතුවලට අදාලව 2012 වසර තුළදී දෙපාර්තමේන්තුව නිකුත් කළ චක්‍රලේඛ පහත සඳහන් පරිදි වේ.

**වගු අංක - 07 කළමනාකරණ සේවා චක්‍රලේඛ - 2012**

| චක්‍රලේඛ අංකය හා දිනය | විෂයය |
|---|---|
| කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 45(1) – 2012.10.10 | 2011 අයවැය යෝජනා අනුව පර්යේෂණ දීමනා ගෙවීම |
| කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 48 – 2012.12.10 | 2013 අයවැය යෝජනා අනුව රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල හා ව්‍යාපෘති කාර්ය මණ්ඩල දීමනා සංශෝධනය කිරීම. |
| කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 49 – 2012.12.24 | රාජ්‍ය සංස්ථා හා සම්පූර්ණ රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට 2012 වර්ෂ සඳහා ප්‍රසාද දීමනා ගෙවීම. |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

# 4. පර්යේෂණ කටයුතු, තොරතුරු හා දත්ත පද්ධතිය

## 4.1 පර්යේෂණ කටයුතු

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරයන් අතරින් රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාවන්ට අදාල වූ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම, රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රශස්ථ කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීම, රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා පිළිබඳ සම්මත මිනුම් හා ප්‍රමිතීන් ගොඩනගා ගැනීම, වැටුප් දීමනා හා අනෙකුත් පාරිශ්‍රමික පිළිබඳ අධ්‍යයනය කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම හා තීරණ ලබා දීම, වත්මන් සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි රාජ්‍ය අංශයේ විවිධ සේවාවන් සඳහා සේවා ව්‍යවස්ථා හා සේවා කොන්දේසි සමාලෝචනයේදී අවශ්‍ය නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම වැනි අවස්ථාවලදී දෙපාර්තමේන්තුවට අනෙකුත් ආයතන සමඟ සමීපව කටයුතු කිරීමට සිදු වේ.

මෙම කටයුතු ප්‍රමාදයකින් තොරව හා නිවැරදිව සිදු කිරීමට දෙපාර්තමේන්තුව සඳහා කාර්යක්ෂම පර්යේෂණ අංශයක් පැවතීම අත්‍යවශ්‍ය වේ. දෙපාර්තමේන්තු කාර්යභාරය ඵලදායීව ඉටු කිරීමේදී අවශ්‍යවන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා තොරතුරු රැස් කිරීම හා එම තොරතුරු විශ්ලේෂණය කර වාර්තා සැපයීම පර්යේෂණ අංශය වෙත පැවරී ඇති ප්‍රධානතම කාර්යභාරය වේ. මෙහිදී අවශ්‍ය විමර්ශනයන්/අධ්‍යයනයන් සඳහා පර්යේෂණ අංශයේ නිලධාරීන් අදාළ ආයතන වෙත පෞද්ගලිකවම යොමු කර තොරතුරු රැස් කිරීම ද සිදු කෙරේ. මේ සඳහා දෙපාර්තමේන්තු පර්යේෂණ අංශයේ ධාරිතාවය පුළුල් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගෙන ඇති අතර ඒ සඳහා දක්ෂ නිලධාරීන් කණ්ඩායමක් හඳුනාගෙන බඳවා ගැනීම සඳහා දැනටමත් සැලසුම් කර ඇත.

## 4.2 තොරතුරු හා දත්ත පද්ධතිය

රාජ්‍ය අංශයේ මානව සම්පත සම්බන්ධ නිවැරදි දත්ත හා තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම, ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ඉහළ වැදගත්කමක් උසුලයි. රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා පාරිශ්‍රමික කළමනාකරණය සහ උපදේශකත්වය පිළිබඳ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වශයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට මෙහිදී වැඩි වගකීමක් පැවරේ. ඒ අනුව ඵලදායි හා ක්‍රමවත් පරිගණකගත දත්ත පද්ධතියක අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගනිමින් 2011 වර්ෂයේ දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අංශය සමග එක්ව සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රජය සතු සමාගම්හි මානව සම්පත සම්බන්ධ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම ආරම්භ කරන ලද අතර, 2012 වර්ෂය තුළදී එම කටයුතුවලින් වැඩි කොටසක් නිම කිරීමට හැකි විය.

රාජ්‍ය අංශයේ මානව සම්පත සම්බන්ධ නිවැරදි සංඛ්‍යාත්මක තොරතුරු මෙම දත්ත පද්ධතියෙන් ලබා ගැනීමේ පහසුකම් වර්තමානයේ සලසා ඇත. ඒ අනුව වැටුප්, සේවාවන් හා කාණ්ඩ ආදී සේවක සංඛ්‍යා වර්ගීකරණයන් පිළිබඳ කරන ලද නිවැරදි තොරතුරු වාර්තා මෙම පද්ධතියෙන් අවශ්‍ය අවස්ථාවලදී පහසුවෙන් ලබා ගත හැකි වීම මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්යයන් විශාල ලෙස පහසු වී ඇති අතර, සපයනු ලබන දත්ත හා තොරතුරුවල නිවැරදිතාවය වර්ධනය වී ඇත. මෙම දත්ත පද්ධතියේ අන්තර්ගත තොරතුරු යාවත්කාලීන කිරීමට ද අවශ්‍ය කටයුතු සලසා ඇත.

දත්ත පද්ධතියේ කාර්යක්ෂමතාවය තවදුරටත් වර්ධනය කිරීමටත් රාජ්‍ය අංශයේ සියලුම ආයතන සමග සම්බන්ධවෙමින් එහි කටයුතු පුළුල් කිරීමටත් 2013 වර්ෂයේ දී සැලසුම් කර ඇත. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව තෘතීය, ද්විතීය හා ප්‍රාථමික යන කාණ්ඩ අනුව වර්ගීකරණය කරන ලද රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව එම පරිගණකගත දත්ත පද්ධතිය තුළින් ලබා ගෙන එම තොරතුරු වගු අංක 08 මගින් දක්වා ඇත.

වගු අංක - 08 සේවා මට්ටම අනුව රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව - 2012/12/31

| පරිපාලන මට්ටම | සේවා මට්ටම | | | | තත්‍ය කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|
| | ජ්‍යෙෂ්ඨ | තෘතීය | ද්විතීය | ප්‍රාථමික | |
| ජාතික | 35,771 | 35,771 | 641,574 | 187,800 | 900,916 |
| පළාත් | 13,675 | 15,632 | 239,553 | 60,792 | 329,652 |
| පළාත් පාලන ආයතන | 996 | 734 | 15,606 | 31,945 | 49,281 |
| **එකතුව** | **50,442** | **52,137** | **896,733** | **280,537** | **1,279,849** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 4.3 අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම

රාජ්‍ය අංශයේ ආයතන කටයුතු, වැටුප් හා දීමනා ආදී දෙපාර්තමේන්තු විෂය පථයට අයත්වන කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් වන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයකි. 2012 වසර තුළ දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා හා ඒවා අයත් වන විෂය ක්ෂේත්‍රය පිළිබඳව තොරතුරු වගු අංක 09 මගින් දක්වා ඇත.

වගු අංක - 09 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා නිරීක්ෂණ වර්ගීකරණය

| අනු අංකය | කාරණය/ක්ෂේත්‍රය | සංදේශ ගණන |
|---|---|---|
| 01 | තනතුරුවලට පත් කිරීම | 78 |
| 02 | සේවය දීර්ඝ කිරීම | 76 |
| 03 | නව තනතුරු ඇති කිරීම | 38 |
| 04 | පාරිශ්‍රමික | 46 |
| 05 | සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටි | 39 |
| 06 | විනය කටයුතු | 13 |
| 07 | කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම | 27 |
| 08 | අනෙකුත් | 82 |
| **එකතුව** | | **399** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

2012 වසර තුළ දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ලබා දෙන ලද මුළු අමාත්‍ය මණ්ඩල සංදේශ අතරින් තනතුරු සඳහා පත් කිරීම, සේවය දීර්ඝ කිරීම සහ පාරිශ්‍රමික කටයුතුවලට අදාළ කරුණු ප්‍රධාන තැනක් ගන්නා ලදී. අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ලබා දීමට අමතරව නිතිපතා ද පැවැත්වෙන ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටු රැස්වීම් සඳහා ද දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය ලබා දෙන ලදී. වසර 2003-2012 දක්වා දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා පිළිබඳ සංසන්දනාත්මක තොරතුරු වගු අංක 10 මගින් දක්වා ඇත.

වගුව අංක - 10 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම 2003-2012

| වර්ෂය | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 863 | 562 | 605 | 820 | 780 | 750 | 1272 | 598 | 1019 | 399 |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 4.4 කමිටු නියෝජන, සම්බන්ධීකරණ කටයුතු හා සන්නිවේදනය

සංවර්ධන අරමුණු හා ආයතන අරමුණු ඉටුකර ගැනීමේ කාර්යයේදී පහත සඳහන් සමුළු හා සාකච්ඡා සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය හා භාණ්ඩාගාර ලේකම් නියෝජනය කරමින් ක්‍රියාකාරී ලෙස දායකත්වය සපයා ඇත.

- ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව
- අමාත්‍ය මණ්ඩලය විසින් දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් ඇතුළත්ව පත් කර ඇති නිලධාරී කමිටු
- රාජ්‍ය ගිණුම් කාරක සභාව (COPA)
- දිස්ත්‍රික් ලේකම්/දිසාපති සමුළු
- ආණ්ඩුකාර සමුළු
- පළාත් ප්‍රධාන අමාත්‍ය සමුළු
- පළාත් ප්‍රධාන ලේකම් සමුළු
- ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා සාකච්ඡා
- ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන කමිටු
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ කළමනාකරණ හා විගණන කමිටු
- ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටු

තවද, විවිධ ආයතනයන්හි ඉල්ලීම් පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයන් වශයෙන්ද මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහභාගි වී ඇත. එසේම, රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල ගැටළු සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් සමග නිරන්තර සාකච්ඡා පවත්වනු ලැබේ. මේ අයුරින්, රාජ්‍ය අංශයේ කාර්යක්ෂම මානව සම්පත් කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කරනු වස් ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යාමට මෙම දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලබයි.

## 5. ආයතන අංශය

දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමේදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රැකියා තෘප්තිය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ. දෙපාර්තමේන්තුවේ භෞතික පරිසරය, රැකියා තෘප්තිය වර්ධනය කරලීමට සමත් මිත්‍රශීලී කාර්යාල පරිසරයක් සකස් කර දීමටත්, ඵලදායී කණ්ඩායමක් සේ කටයුතු කිරීමට අවශ්‍ය සෙසු කාර්ය මණ්ඩලයට සහයෝගය ලබා දීමටත් ආයතන අංශය කටයුතු කරන ලදී.

2012 වසර තුළ දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 77 ක් වූ අතර එයින් තනතුරු 23 ක් පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු තනතුරු 23 න් 11 ක්ම ජ්‍යෙෂ්ඨ මට්ටමේ (අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 01 ක්, අධ්‍යක්ෂ තනතුරු 03 ක්, සහකාර අධ්‍යක්ෂ තනතුරු 06 ක් හා ගණකාධිකාරී තනතුරු 01 ක්) තනතුරු විය. දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය අනුව අවශ්‍ය වන ප්‍රශස්ථ කාර්ය මණ්ඩලය හඳුනා ගැනීම 2013 වර්ෂයේදී සිදු කිරීමට නියමිත අතර අවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම පිළිබඳ අවධානය යොමු කර තිබේ.

කෙසේ වුවද 2012 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව සතුව තිබූ මානව හා භෞතික සම්පත් උපරිම කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායීතාවයෙන් යුතුව භාවිතා කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත සේවාවන් බාධාවකින් තොරව පවත්වා ගැනීමට සමත් විය. 2012.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩල තොරතුරු වගු අංක 11 මගින් දැක්වේ.

**වගු අංක - 11 කර්ය මණ්ඩල තොරතුරු 2012.12.31 දිනට**

| අනු අංකය | තනතුර | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | 00 |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 02 | 01 | 01 |
| 03 | අධ්‍යක්ෂ | 07 | 04 | 03 |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ | 10 | 05 | 05 |
| 05 | ගණකාධිකාරී | 01 | 00 | 01 |
| 06 | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය) | 01 | 00 | 01 |
| 07 | පරිපාලන නිලධාරී | 01 | 01 | 00 |
| 08 | භාෂා පරිවර්තක | 01 | 01 | 00 |
| 09 | පර්යේෂණ සහකාර | 07 | 07 | 00 |
| 10 | තොරතුරු තාක්ෂණ සහකාර | 01 | 01 | 00 |
| 11 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 29 | 23 | 06 |
| 12 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 03 | 01 | 02 |
| 13 | රියදුරු | 06 | 03 | 03 |
| 14 | කාර්යාල කාර්ය සහායක | 07 | 06 | 01 |
| | **එකතුව** | **77** | **54** | **23** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

2012.12.31 දිනට දෙපාර්තමේන්තු සේවයේ නිරත වූ කාර්ය මණ්ඩලය පහත අංක 01 ලේඛනය මගින් දක්වා ඇත.

**ලේඛනය - 01 කාර්ය මණ්ඩලය 2012.12.31 දිනට**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | එන්. ගොඩකන්ද මිය | අධ්‍යක්ෂ ජනරාල් |
| 02 | ඒ.එම්. අසංග දයාරත්න මයා | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| 03 | ජී.ඩී. අනුර පියබන්දු මයා | අධ්‍යක්ෂ |
| 04 | එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී. සත්කුමාර මයා | අධ්‍යක්ෂ |
| 05 | කේ.ජී.ප්‍රදීප් පුෂ්පකුමාර මයා | අධ්‍යක්ෂ |
| 06 | ආර්.කේ.ජී.ඩී.කේ. විජේසිංහ මිය | අධ්‍යක්ෂ |
| 07 | එම්.කේ.එස්. ජයසේන මිය | සහකාර අධ්‍යක්ෂ |
| 08 | එස්.එන්. අත්තනායක මිය | සහකාර අධ්‍යක්ෂ |
| 09 | එම්.ඒ. කරුණාරත්න මයා | සහකාර අධ්‍යක්ෂ |
| 10 | ඩබ්.එච්.ජී. කෝසල මයා | සහකාර අධ්‍යක්ෂ |
| 11 | ඩබ්.පී. සෙව්වන්දි මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ |
| 12 | ඒ.ආර්.පී.දයානි රාජපක්ෂ මිය | පරිපාලන නිලධාරී |
| 13 | පී.ඩී.ඩී. සමරසේකර මිය | භාෂා පරිවර්තක |
| 14 | එම්.ඩබ්. ජයන්ත මයා | පර්යේෂණ සහකාර |
| 15 | ආර්.කේ.ඒ. ක්‍රිශාන්ත මයා | පර්යේෂණ සහකාර |
| 16 | කේ.ආර්. පරණවිතාන මයා | පර්යේෂණ සහකාර |
| 17 | එස්.එම්.ඩී. සමරවීර මයා | පර්යේෂණ සහකාර |
| 18 | එම්.එම්.ඒ.එන්. මල්පෝරු මිය | පර්යේෂණ සහකාර |
| 19 | ඒ.කේ.පී. නිල්මිණි මිය | පර්යේෂණ සහකාර |
| 20 | බී.එම්. සරත් මයා | පර්යේෂණ සහකාර |
| 21 | එම්.පී.එස්. සල්ගාදු මයා | තොරතුරු තාක්ෂණ සහකාර |
| 22 | ඒ.ආර්. සහිඩීන් මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 23 | ඩබ්.එස්.එස්.පී. ප්‍රනාන්දු මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 24 | ඩබ්.ඒ.ආර්. විජේසේකර මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 25 | එච්.යූ.එන්. ෆොන්සේකා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 26 | ඩබ්.ටී.එම්. ප්‍රියන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 27 | ජේ.ඒ.එන්. දේදුණු මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 28 | ඒ.එම්.එම්. ශ්‍යාමලී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 29 | ඩබ්.එස්.කේ. මාලගම්මන මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 30 | වයි.එන්. කලුආරච්චි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 31 | කේ.පී. පද්මකාන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 32 | එස්.එච්.එස්. පවිත්‍රා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 33 | එම්.එම්. අලුත්ගේ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 34 | එම්.ඩී.ආර්. රංජනී මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 35 | කේ.ටී.පී. රත්සිමාලි මෙනවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |

| | | |
|---|---|---|
| 36 | ජී.එන්.එච්. අබයවර්ධන මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 37 | එම්.එන්.එම්. උසාමා මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 38 | කේ.අයි. පෙරේරා මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 39 | කේ.එස්.එස්.ආර්. සෙනෙවිරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 40 | එච්.එල්. මංගලිකා මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 41 | ප්‍රියන්ත සතරසිංහ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 42 | ජී.ජී.එන්.එස්. රාජපක්ෂ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 43 | දයානි ඩයස් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 44 | එස්.ඒ.ජී.ඩී.එන්. ජයකොඩි මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර |
| 45 | හිරන්ති දීගල මෙනෙවිය | තොරතුරු සන්නිවේදන සහකාර |
| 46 | එම්.කේ. යසවර්ධන මයා | රියදුරු |
| 47 | ආර්.සී. කරුණාරත්න මයා | රියදුරු |
| 48 | ෂාම් නිශාන්ත මයා | රියදුරු |
| 49 | ඩබ්.ඒ හේමසිරි මයා | කාර්යාල කාර්ය සහායක |
| 50 | ජී.එස්.ආර්. ඒකනායක මයා | කාර්යාල කාර්ය සහායක |
| 51 | ටී.ජී. ආනන්ද මයා | කාර්යාල කාර්ය සහායක |
| 52 | ඒ.එන්.සී ද අල්විස් මයා | කාර්යාල කාර්ය සහායක |
| 53 | ඩබ්. නන්දන මයා | කාර්යාල කාර්ය සහායක |
| 54 | සුසන්ත ප්‍රභාත් මයා | කාර්යාල කාර්ය සහායක |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.1 වයස් කාණ්ඩය අනුව කාර්ය මණ්ඩලය වර්ගීකරණය

**වගු අංක - 12 වයස් කාණ්ඩය අනුව කාර්ය මණ්ඩලය වර්ගීකරණය**

| අනු අංකය | වයස් කාණ්ඩය | නිලධාරී සංඛ්‍යාව |
|---|---|---|
| 01 | 20-30 | 04 |
| 02 | 31-40 | 20 |
| 03 | 41-50 | 20 |
| 04 | 51-60 | 10 |
| **එකතුව** | | **54** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.2 ස්ථාන මාරුවීම්

රාජ්‍ය සේවයේ සාමාන්‍ය පරිපාටීන්ට අනුකූලව දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2012 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරුවීම් ලැබූ/වෙනත් තනතුරු සඳහා පත්වීම් ලැබූ නිලධාරීන් සංඛ්‍යාව 31ක් විය.

**ලේඛනය - 02** **2012 වර්ෂයේ ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු ලද දිනය |
|---|---|---|---|
| 01 | ඒ.කේ.එන්. වික්‍රමසිංහ මයා | අධ්‍යක්ෂ | 2012.01.02 |
| 02 | ඩබ්.එම්.සී.පී. මොහොට්ටිගෙදර මයා | සහකාර අධ්‍යක්ෂ | 2012.01.02 |
| 03 | ඩී. විජේසිරිවර්ධන මයා | සහකාර අධ්‍යක්ෂ | 2012.07.15 |
| 04 | ඩී.එච්. කලන්සූරිය මිය | ගණකාධිකාරී | 2012.09.17 |
| 05 | ජී.ටී.එම්. ෆොන්සේකා මිය | සහකාර අධ්‍යක්ෂ (තො.තා.) | 2012.09.12 |
| 06 | එන්.එන්. රණසිංහ මිය | පරිපාලන නිලධාරී | 2012.06.24 |
| 07 | ආර්.එස්. කොඩිකාර මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.01.02 |
| 08 | කේ.පී. හේවාගම මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.01.02 |
| 09 | එම්.ඒ.එස්. කැලුම් මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.01.02 |
| 10 | එල්.ඒ.එස්. සිල්වා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.01.10 |
| 11 | ඩබ්.ආර්.එම්. පෙරේරා මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.04.03 |
| 12 | ඩබ්.කේ.ඒ.ද සිල්වා මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.04.04 |
| 13 | කේ.ඒ.ඩී.එස්. වසන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.06.24 |
| 14 | ඩබ්.ඒ. පියසීලි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.07.02 |
| 15 | ඩී.එම්.එස්. මල්කාන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.09.17 |
| 16 | පී.ඒ. ඉන්දික මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.12.20 |
| 17 | ජේ.කේ.ඩී.එම්. තිලකරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.12.17 |
| 18 | බී.ජී.එන්. ලක්මිණි මිය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 2012.01.26 |
| 19 | ජේ. විදානපතිරණ මයා | රියදුරු | 2012.01.02 |
| 20 | ජේ.ඒ.ඩී. විමල් කුමාර මයා | රියදුරු | 2012.03.02 |
| 21 | ඩබ්.එම්.එස්. ජගත් කුමාර මයා | රියදුරු | 2012.04.09 |
| 22 | කේ.ඩබ්. ඥාණවිමල් මයා | රියදුරු | 2012.04.23 |
| 23 | ලක්ෂ්මන් නාපෙවිතාන මයා | රියදුරු | 2012.05.07 |
| 24 | එම්.ඒ.එච්. ඉනාමුල් හසන් මයා | රියදුරු | 2012.07.15 |
| 25 | ඒ.ඒ.එස්.පී. අමරසිංහ මයා | රියදුරු | 2012.12.07 |
| 26 | ඩී.එම්.එස්. පෙරේරා මයා | කාර්යාල කාර්ය සහායක | 2012.01.02 |
| 27 | කේ.ඩී. සුනිල් දයාරත්න මයා | කාර්යාල කාර්ය සහායක | 2012.05.01 |
| 28 | එස්.එන්.ජේ. ආනන්ද ද සිල්වා මිය | කාර්යාල කාර්ය සහායක | 2012.08.16 |
| 29 | ඒ.ජී. වසන්තසිරි මයා | කාර්යාල කාර්ය සහායක | 2012.03.26 |

මූලාශ්‍රය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

**ලේඛනය - 03** **වෙනත් තනතුරු සඳහා පත්වීම් ලද නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | පත්වීම් ලද දිනය |
|---|---|---|---|
| 01 | ඒ.ආර්.පී.ඩී. රාජපක්ෂ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.09.27 |
| 02 | ඒ.ඩබ්.ඒ. ගොඩගම මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.10.03 |

2012 වර්ෂය තුළ ස්ථාන මාරුවීම් ලැබ දෙපාර්තමේන්තුවට පැමිණි නිලධාරීන් සංඛ්‍යාව 22 ක් විය. මොවුන් විවිධ රාජ්‍ය ආයතනවල සේවය කර අත්දැකීම් ලද පිරිසක් විය.

**ලේඛනය – 04** **2012 වර්ෂය තුළ ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්**

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු වී පැමිණි දිනය |
|---|---|---|---|
| 01 | ජී.ඩී. අනුර පියබන්දු මයා | අධ්‍යක්ෂ | 2012.01.03 |
| 02 | ආර්.කේ.ජී.ඩී.කේ. විජේසිංහ මිය | අධ්‍යක්ෂ | 2012.01.03 |
| 03 | ඩබ්.පී. සෙව්වන්දි මෙනෙවිය | සහකාර අධ්‍යක්ෂ | 2012.01.02 |
| 04 | ඒ.ආර්.පී.ඩී. රාජපක්ෂ මිය | පරිපාලන නිලධාරී | 2012.10.01 |
| 05 | බී.එම්. සරත් මයා | පර්යේෂණ සහකාර | 2012.02.03 |
| 06 | කේ.අයි. පෙරේරා මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.01.04 |
| 07 | ඒ.ආර්.පී.ඩී. රාජපක්ෂ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.01.04 |
| 08 | කේ.එස්.එස්.ආර්. සෙනෙවිරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.01.04 |
| 09 | ඩබ්.ඒ. පියසීලි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.01.05 |
| 10 | එච්.එල්. මංගලිකා මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.02.27 |
| 11 | ජී.ජී.එන්.එස්. රාජපක්ෂ මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.04.04 |
| 12 | ඩබ්.ජී.ජී.ඒ.ඩී.එම්. ඩයස් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.04.16 |
| 13 | එස්.ඒ.ඩබ්.පී. සතරසිංහ මයා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.06.01 |
| 14 | එස්.ඒ.ජී.ඩී.එන්. ජයකොඩි මෙනෙවිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2012.11.01 |
| 15 | හිරන්ති දීගල මෙනෙවිය | තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර | 2012.01.23 |
| 16 | ඩබ්.එම්.සී. ජගත් කුමාර මයා | රියදුරු | 2012.01.02 |
| 17 | කේ.ඩබ්. ඥානවිමල් මයා | රියදුරු | 2012.04.03 |
| 18 | ඒ.ඒ.එස්.එල්.පී. අමරසිංහ මයා | රියදුරු | 2012.05.09 |
| 19 | ඒ.එන්.සී.ද අල්විස් මයා | කාර්යාල කාර්ය සහායක | 2012.01.03 |

| | | | |
|---|---|---|---|
| 20 | ඩබ්. නන්දන මයා | කාර්යාල කාර්ය සහායක | 2012.01.23 |
| 21 | කේ.ඩී.කේ.එස්. දයාරත්න මයා | කාර්යාල කාර්ය සහායක | 2012.03.21 |
| 22 | ඒ.ඊ. සුසන්ත ප්‍රභාත් මයා | කාර්යාල කාර්ය සහායක | 2012.04.19 |

මූලාශ්‍රය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 5.3 පුහුණු වැඩසටහන්

### 5.3.1 දේශීය පුහුණු වැඩසටහන්

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ කාර්ය සාධන වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් සැලසුම්ගතව පැවැත්වීම අරමුණු කොටගෙන දෙපාර්තමේන්තුව සඳහා වාර්ෂික පුහුණු සැලැස්මක් සකස් කරනු ලැබේ. දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ අවශ්‍යතා මෙන්ම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරයන්ද මෙම වාර්ෂික පුහුණු සැලැස්ම සකස් කිරීමේදී සැලකිල්ලට ගනු ලැබේ. ඒ අනුව 2012 වර්ෂය තුළ ලබා දුන් පුහුණු වීම් වගු අංක 13 මගින් දක්වා ඇත.

**වගු අංක -13 පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වීම**

| අනු අංකය | ක්ෂේත්‍රය | පුහුණු ආයතනය | සහභාගි වූ ගණන |
|---|---|---|---|
| 01 | පුහුණු පාඨමාලාව | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 |
| 02 | කළමනාකරණ පුහුණුව | කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය | 01 |
| 03 | ආයතන කටයුතු | රාජ්‍ය සේවා පුහුණු ආයතනය | 07 |
| 04 | පරිගණක පුහුණුව | මිලෝදා ආයතනය | 05 |
| **එකතුව** | | | **14** |

### 5.3.2 විදේශීය පුහුණු වැඩසටහන්

දෙපාර්තමේන්තු නිලධාරීන්ට විදේශීය පුහුණු අවශ්‍යතා ලබා දෙමින් ඔවුන්ගේ අත්දැකීම් හා විෂය දැනුම වර්ධනය කිරීමට 2012 වර්ෂය තුළදී ද කටයුතු කරන ලදී. ඒ අනුව නිලධාරීන් 03 දෙනෙකුට විදේශීය පුහුණු අවස්ථාවන් හිමි විය.

ලේඛනය - 05 විදේශීය පුහුණු -2012

| අනු අංකය | නම | තනතුර | ලැබූ පුහුණුව | රට | කාලය |
|---|---|---|---|---|---|
| 01 | එම්.ඒ. කරුණාරත්න මයා | සහකාර අධ්‍යක්ෂ | ආර්ථික සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2012.07.25 - 2012.08.17 |
| 02 | ඩබ්.එච්.ජී. ගයාන් කෝසල මයා | සහකාර අධ්‍යක්ෂ | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා විදේශ ප්‍රවීණත්වය හඳුන්වාදීම සහ සමාජ ආර්ථික සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2012.10.14 - 2012.11.06 |
| 03 | එස්.ආර්.ඩබ්.එම්.ආර්.පි. සත්කුමාර මයා | අධ්‍යක්ෂ | දූපත් ආශ්‍රිත සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2012.11.07 - 2012.11.30 |

## 5.4 වාර්ෂික තැපැල

2011 වසරේ දෙපාර්තමේන්තුවට ලැබුණු ලිපි සංඛ්‍යාව 7114 ක් විය. මෙම ලිපි විවිධ විෂයන් සම්බන්ධයෙන් ලැබී තිබුණු අතර රාජ්‍ය ආයතන සඳහා නව තනතුරු ඇති කර ගැනීම, පුරප්පාඩු පිරවීම සඳහා දෙපාර්තමේන්තු අනුමැතිය ඉල්ලීම්, කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පරිපාටි හා නිරීක්ෂණ හා නිර්දේශ ඉල්ලීම්, පැහැදිලි කරවා ගැනීම් හා සාමාන්‍ය පරිපාලනය යන විෂයන් ප්‍රධාන තැනක් ගෙන තිබුණි.

වගු අංක - 14 2012 වර්ෂය තුල ලැබුණු ලිපි සංඛ්‍යාව

| අනු අංකය | මාසය | ලිපි සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජනවාරි | 558 |
| 02 | පෙබරවාරි | 299 |
| 03 | මාර්තු | 516 |
| 04 | අප්‍රියෙල් | 527 |
| 05 | මැයි | 516 |
| 06 | ජූනි | 699 |
| 07 | ජූලි | 729 |
| 08 | අගෝස්තු | 835 |
| 09 | සැප්තැම්බර් | 610 |
| 10 | ඔක්තෝබර් | 769 |
| 11 | නොවැම්බර් | 527 |
| 12 | දෙසැම්බර් | 529 |
| | **එකතුව** | **7114** |

මූලාශ්‍රය : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## 6. මූල්‍ය අංශය

2012 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් වැඩසටහන යටතේ මානව සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 242 වැය ශීර්ෂයට වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.34,250,000/- ක් වූ අතර සත්‍ය වියදම රු.31,857,723.35 ක් විය. ඒ අනුව වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් 93% ක් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන් සපුරා ගනිමින් අරපිරිමැසුම්දායක ලෙස භාවිතා කර ඇත. මූල්‍ය ප්‍රගති වාර්තාව පහත පරිදි වේ.

වගු අංක - 15 මූල්‍ය ප්‍රගති වාර්තාව


| වැය විස්තරය | | 2011 | | | 2012 | | |
|---|---|---|---|---|---|---|---|
| | | අනුමත ප්‍රතිපාදනය (අවුරා තබන ලද ප්‍රතිපාදන හැර) (රුපියල්) | මුළු වියදම (රුපියල්) | වියදම් ප්‍රතිශතය % | අනුමත ප්‍රතිපාදනය (රුපියල්) | මුළු වියදම (රුපියල්) | වියදම් ප්‍රතිශතය % |
| **පුනරාවර්තන වියදම්** | | **31,267,000.00** | **30,884,182.91** | **99** | **32,800,000.00** | **30,995,444.50** | **94** |
| **පුද්ගල පඩිනඩි** | | **22,768,000.00** | **22,544,885.95** | **99** | **23,760,000.00** | **22,931,076.91** | **97** |
| 1001 | වැටුප් හා වේතන | 16,400,000.00 | 16,205,457.32 | 99 | 16,150,000.00 | 15,358,040.70 | 95 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 810,000.00 | 792,082.60 | 98 | 715,000.00 | 693,128.46 | 97 |
| 1003 | වෙනත් දීමනා | 5,558,000.00 | 5,547,346.03 | 99 | 6,895,000.00 | 6,879,907.75 | 99 |
| **ගමන් වියදම්** | | **1,081,000.00** | **1,078,863.48** | **99** | **435,000.00** | **401,557.72** | **92** |
| 1101 | දේශීය | 65,000.00 | 62,950.00 | 97 | 100,000.00 | 77,425.50 | 77 |
| 1102 | විදේශීය | 1,016,000.00 | 1,015,913.48 | 99 | 335,000.00 | 324,132.22 | 97 |
| සැපයීම | | 2,737,000.00 | 2,712,338.23 | 99 | 3,785,000.00 | 3,168,916.10 | 84 |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 807,000.00 | 806,840.70 | 99 | 1,055,000.00 | 1,002,952.60 | 95 |
| 1202 | ඉන්ධන | 1,788,000.00 | 1,783,851.13 | 99 | 2,500,000.00 | 2,013,293.50 | 81 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 140,000.00 | 119,696.40 | 85 | 180,000.00 | 152,535.00 | 85 |
| 1205 | වෙනත් | 2,000.00 | 1,950.00 | 98 | 50,000.00 | 135.00 | 0 |
| **නඩත්තු වියදම්** | | **636,000.00** | **595,295.11** | **94** | **1,000,000.00** | **897,587.52** | **90** |
| 1301 | වාහන | 517,000.00 | 476,498.75 | 92 | 830,000.00 | 818,278.12 | 99 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 119,000.00 | 118,796.36 | 99 | 170,000.00 | 79,309.40 | 47 |
| **සේවා** | | **3,245,000.00** | **3,193,525.08** | **98** | **3,070,000.00** | **2,895,020.96** | **94** |
| 1401 | ප්‍රවාහන | 1,068,000.00 | 1,067,700.00 | 99 | 1,400,000.00 | 1,312,435.50 | 94 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 1,420,000.00 | 1,369,560.38 | 96 | 1,200,000.00 | 1,174,399.93 | 98 |
| 1405 | වෙනත් | 757,000.00 | 756,264.70 | 99 | 470,000.00 | 408,185.53 | 87 |
| **මාරු කිරීම්** | | **800,000.00** | **759,275.06** | **95** | **750,000.00** | **701,285.29** | **94** |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1506 | රජයේ නිලධාරීන් සඳහා දේපළ ණය පොළී | 800,000.00 | 759,275.06 | 95 | 750,000.00 | 701,285.29 | 94 |
| **මූලධන වියදම්** | | **5,500,000.00** | **4,397,555.71** | **80** | **1,450,000.00** | **862,278.85** | **59** |
| **මූලධන වත්කම්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම** | | **663,000.00** | **633,101.44** | **95** | **636,000.00** | **566,023.85** | **89** |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 63,000.00 | 57,714.94 | 92 | 36,000.00 | 35,140.06 | 98 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 100,000.00 | 90,580.85 | 91 | 100,000.00 | 77,564.00 | 78 |
| 2003 | වාහන | 500,000.00 | 484,805.65 | 97 | 500,000.00 | 453,319.79 | 91 |
| **මූලධන වත්කම් අත්පත් කරගැනීම** | | **4,100,000.00** | **3,280,938.27** | **80** | **153,000.00** | **96,995.00** | **63** |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 4,100,000.00 | 3,280,938.27 | 80 | 153,000.00 | 96,995.00 | 63 |
| **හැකියා වර්ධනය** | | **737,000.00** | **483,516.00** | **66** | **661,000.00** | **199,260.00** | **30** |
| 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 737,000.00 | 483,516.00 | 66 | 661,000.00 | 199,260.00 | 30 |
| **මුළු එකතුව** | | **36,767,000.00** | **35,281,738.62** | **96** | **34,250,000.00** | **31,857,723.35** | **93** |

මූලාශ්‍රය : ගිණුම් අංශය - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

## සංවිධාන ව්‍යුහය

## කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව




○ සහායක කාර්ය මණ්ඩලය - රාජ්‍ය කළමනාකරණ සහකාර, රියදුරු, කාර්යාල කාර්ය සහායක